සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017

# 52 - නර්තනය (දේශීය)

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

රහස්‍යයි
அந்தரங்கமானது

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2017
க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2017

විෂයය අංකය } 52 විෂයය } නර්තනය (දේශීය)

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம் - I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 2 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 |
| 04. | 2 | 14. | 4 | 24. | 3 |
| 05. | 1 | 15. | 2 | 25. | 5 |
| 06. | 2 | 16. | 3 | | |
| 07. | 3 | 17. | 3 | | |
| 08. | 4 | 18. | 3 | | |
| 09. | 4 | 19. | 5 | | |
| 10. | 1 | 20. | 1 | | |

1 - 25 ලකුණු 2 x 25 = 50

| | | |
|---|---|---|
| 26. | ත්‍රි තාල් | |
| 27. | සබරගමු | |
| 28. | 1978 | |
| 29. | ජස | |
| 30. | පත්තිනි | |
| 31. | කොහොඹා කංකාරිය | |
| 32. | රතු | |
| 33. | වර්ණ හා රේඛා | |
| 34. | ශිව | |
| 35. | 15 | |
| 36. | කතකලි | මණිපුරි |
| 37. | රුක්මණි දේවි අරුන්ඩේල් | උදය ශංකර් |
| 38. | දෙවොල් මඩුව | සන්නියකුම / 18 සන්නිය |
| 39. | කෝලම් | මුදලි |
| 40. | කොළ | රතුවන්දම් (මැජෙන්ටා) |
| 41. | සබරගමු | පහතරට |
| 42. | ප්‍රේම කුමාර එපිටවෙල | ඒ ඉඹුල්ගොඩ |
| 43. | පහතරට | සබරගමු |
| 44. | ගල් කැටයම් | ලී කැටයම් |
| 45. | චිත්‍රසේන ඩයස් | වජිරා චිත්‍රසේන |
| 46. | භරතමුණි | නන්දිකේශ්වර |
| 47. | 4 | 3 |
| 48. | කතකලි | මනිපුරි |
| 49. | 32 | 16 |
| 50. | විශ්ම | අද්භූත |

**ප්‍රශ්න අංක 01 - 25 දක්වා (02 x 25) ලකුණු 50**

**ප්‍රශ්න අංක 26 - 50 දක්වා (02 x 25) ලකුණු 50**

**මුළු ලකුණු 100**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* I වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන, ප්‍රස්තාර කරන්න.

(අ) "තකුං ජිං ජිං තක ජිං ගත රුජිං කඩතක"
(ආ) "තක දිත් තක දොම් දොං දිං තකදොම්"
(ඇ) "ජිං ජිං තත් ජිමිතක ජිමිකත"

(ii) පහත සඳහන් කවි පදය මාත්‍රා තුනේ, තනි තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"ඉපල් පිටින් ගහන අච්ච පිටට ඉහිරවන්නේ...
තාදිගු තරි යේ දිගු තරි ඒක එහෙම වන්නේ"

(iii) මයුරා වන්නමේ අඩව්ව/ශුද්ධ තාලයේ ඉරට්ටිය/නාග ගජගා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**2.** "ශාන්තිකර්මවල දී සාම්ප්‍රදායික නර්තනවල ආවේණික ලක්ෂණ, විවිධතා හා සමානතා මෙන් ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යමාන වේ."

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා දෙවොල් මඩු ශාන්තිකර්මයන්හි නාට්‍යමය පෙළපාළිවල චරිත නිරූපණ අවස්ථා **දෙකක්** ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

(ii) සමාජ සම්බන්ධතා හා සාර්ධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) පුරාවෘත්ත මගින් හෙළි වන බෞද්ධාගමික පසුබිම හා සමාජ විශ්වාස සන්නියකුම යාගය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

**3.** අභිනය යන සංකල්පය දේශීය ශාන්තිකර්මවල ප්‍රාසංගික බව වර්ධනය කිරීමෙහිලා බෙහෙවින් බලපාන සාධකයක් වේ.

(i) කොහොඹා කංකාරියේ සතර අභින උපයෝගීතාව ඉහත පාඨය මගින් සාකච්ඡා කරන්න.

(ii) බලි ශාන්තිකර්මයේ ඇති සෞන්දර්යාත්මක වටිනාකම ආහාර්ය අභිනය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා වාචික හා ආහාර්ය අභිනය යොදා ගන්නා ආකාරය නාට්‍යමය අවස්ථාවක් මගින් විමසීමට ලක් කරන්න.

## II කොටස

**4.** දේශීය නර්තනය ව්‍යාප්ත කිරීමේ දී යුගාන්තර වශයෙන් විවිධ සාධක බලපා ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

(i) උඩරට වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව සපයන්න.

(ii) "නර්තන කලාවේ ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී දේශාටන වාර්තා ද වඩා වැදගත් වේ." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iii) ක්‍රි. ව. 1980 න් පසු දේශීය නර්තනයේ ඇති වූ සමාජීය වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

**5.** (i) **සොකරි නාටකයේ එන චරිත දෙකක් නම් කර, එම එක් එක් චරිතයට භාවිත බෙර පදය හා කවිය බැගින් ලියන්න.**

(ii) **"ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන් ම, ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ." නිදර්ශනාත්මකව විග්‍රහයක් කරන්න.**

(iii) **කෝලම් චරිත නිරූපණය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය චරිත දෙකක් ඇසුරෙන් විශ්ලේෂණය කරන්න.**

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි (අ),(ආ),(ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ශ්‍රීමති මේනකා | පදම් | පුංගි - පෙනා |
| රුක්මණී දේවි අරුන්ඩේල් | ලායිහරෝබා | චෙන්ඩා - එඩැක්ක |
| බාලසරස්වති | තෝඩායම් | මෘදංගම් - නටුවාංගම් |
| නවාබ් වජීඩ් අලීෂා | ගත් නිකාස් | පක්වාජ් - තබ්ලා |

(i) (අ) අඩයාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය කවුද? ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ii) (ආ) කථකලි නර්තනයේ ශාස්ත්‍රීය නර්තන අංගය තෝරා, එම නර්තනය පිළිබඳ කරුණු දක්වන්න.

(iii) (ඉ) කථක් නර්තනය හා සබැඳි වාද්‍ය භාණ්ඩවල ව්‍යුහය හා ඒවායේ විශේෂතා ගෙනහැර දක්වන්න.

**7.** (i) රසභාව ඇතිය හැකි අවස්ථාවක් රටයකුම හෝ සන්නියකුම ශාන්තිකර්මය ඇසුරෙන් විස්තර කරන්න.

(ii) බටහිර බැලේ (Ballet) සංකල්පය සහ දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය සංසන්දනය කරන්න.

(iii) නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරණයේ ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

## IV කොටස

**8.** නව නර්තන කලාවේ ප්‍රවණතා දේශීය සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රවර්ධනයට බෙහෙවින් බලපා ඇත.

(i) සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට එක් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ii) නව ප්‍රවණතා හමුවේ සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කළ හැකි ද? මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(iii) "චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අතර අද්‍යතන නිර්මාණවල එය වඩාත් ඉස්මතු වේ." ඇගයීමක් කරන්න.

**9.** (i) පැරණි හා නූතන රංග භූමි අලංකරණය හා විවිධ ශිල්පක්‍රම පිළිබඳ තුලනාත්මක ව පිරික්සන්න.

(ii) දේශීය ශාන්තිකර්මවල රංගභූමි අලංකරණයේ දී භාවිත වන අමුද්‍රව්‍ය, වර්ණ හා සැරසිලි පිළිබඳ විමසුමක් කරන්න.

(iii) "අද්‍යතන වේදිකාවේ දක්නට ලැබෙන වෙස් මෝස්තර හා රංගාලෝකය, නිර්මාණාත්මක නර්තනයේ ප්‍රාසංගික බවට වඩාත් ඉවහල් වේ." විග්‍රහයක් කරන්න.

***

# නර්තනය - (දේශීය) II

## I කොටස

**1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන, ප්‍රස්තාර කරන්න.**

**(අ) "තකුං ජිං ජිං තක ජිංගත රුජිං කඩතක"**

**(ආ) "තක දිත් තක දොම් දොං දිං තකදොම්"**

**(ඇ) "ජිං ජිං තත් ජිමිතක ජිමිතක"**

උඩරට සම්ප්‍රදාය

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | කුං | ජිං | - | ජිං | - | ත | ක | ජිං | - | ග | ත | රු | ජිං | කඩ | තක |

පහතරට සම්ප්‍රදාය

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | ක | දිත් | - | ත | ක | දොම් | - | දොං | - | දිං | - | ත | ක | දොම් | - |

සබරගමු සම්ප්‍රදාය

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | + | ජිං | - | ජිං | - | තත් | - | ජි | මි | ත | ක | ජි | මි | ත | ක |

| ∧ | | ∧ | | ∧ | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ජිං | - | තත් | - | ජි | මි | ත | ක | ජි | මි | ත | ක |

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට - ලකුණු 02

බෙර පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු 04 - මුළු ලකුණු 06

**(ii) පහත සඳහන් කවි පදය මාත්‍රා තුනේ, තනි තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.**

**"ඉපල් පිටින් ගහන අව්ව පිටට ඉහිරවන්නේ**

**තාදිගු තරි යේ දිගු තරි ඒක එහෙම වන්නේ"**

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | ඉ | පල් | පි | ටින් | - | ග | හ | න | අව් | - | ව |
| + | පිට | ට | ඉ | හි | ර | වන් | - | නේ | - | - | - |
| + | තා- | දි | ගු | ත | රි | යේ | - | දි | ගු | ත | රි |
| + | ඒ | ක | ඒ | හෙ | ම | වන් | - | නේ | - | - | - |

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට - ලකුණු 02
කවි පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු 04 මුළු ලකුණු 06

**(iii) මයුරා වන්නමේ අඩව්ව/ශුද්ධ තාලයේ ඉරට්ටිය/නාග ගජගා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.**

මයුරා වන්නමේ අඩව්ව

| ∧ | | ∧ | | / | | | ∧ | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| + | + | + | + | ගජ් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් | + | + | + | + | ගජ් | ජිං | ගත |
| කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත | තරි | කිට | කුන් | දත් | ත | හර් | ජිත් |
| + | + | + | + | ගජ් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් | තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් |
| තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් | තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් |
| කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | ත | හර් | ජිත් |
| කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | ත | හර් | ජිත් |
| තහර් | ජිත් | තහර් | ජිත් | ත | හර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | ත | හර් | ජිත් |
| තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | ගත | කුං | තක | ජිං | කුදු | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | ත | හර් | ජිත් | ගත් | - | තත් | - | ක | ක | ට |
| තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | |

ශුද්ධ තාලයේ ඉරට්ටිය

| ∧ | | ∧ | | / | | | ∧ | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| තත් | - | දි | මි | ත | ක | - | තිත් | - | තිත් | - | තෙයි | - | - |
| ත | ක | දි | මි | ත | ක | - | තිත් | - | තිත් | - | තෙයි | - | - |
| තත් | - | දි | මි | ත | ක | - | ත | ක | දි | මි | ත | ක | - |
| දි | මි | තත් | - | දිමි | ත | ක | තත් | - | දි | මි | ත | ක | - |
| තිත් | - | තිත් | - | තෙයි | | | | | | | | | |

නාග ගජගා වන්නමේ අඩව්ව

| / | | | ∧ | | ∧ | | / | | | ∧ | | ∧ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
| ත | හර් | ද | තත් | - | තත් | - | ත | තත් | - | තත් | - | තත් | - |
| ත | හර් | ද | තක් | - | කි | ට | ත | ක | ට | කු | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොං | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොං | - | දොං | - | ත | ගත් | - | තත් | - |
| ග | තත් | - | කු | ද | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| ග | තත් | - | කු | ද | ග | ත | තා | | | | | | |

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට - ලකුණු 02
නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු 06 මුළු ලකුණු 08

**2. "ශාන්තිකර්මවල දී සාම්ප්‍රදායික නර්තනවල ආවේණික ලක්ෂණ, විවිධතා හා සමානතා මෙන් ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යමාන වේ."**

**(i) පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා දෙවොල් මඩු ශාන්තිකර්මයන්හි නාට්‍යමය පෙළපාළිවල චරිත නිරූපණ අවස්ථා දෙකක් ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.**

- ⋆ රටයකුම - නානුමුරය, කපුයක්කාරිය, දරුනැලවිල්ල
- ⋆ දෙවොල් මඩුව - අඹ විදමන, දෙවොල් ගොඩබැසීම, මරා ඉපැද්දීම
- ⋆ ඉහත නාට්‍යමය පෙළපාලි අතුරින් චරිත දෙකක් තෝරාගෙන ඇත්නම්,

  (රටයකුමේ - රිද්දි බිසව්, දෙවොල් මඩුවේ - දොවොල් ගොඩබැසීම හා අඹ විදමනෙහි මහලු චරිතය)

- ⋆ පහතරට සම්ප්‍රදායට ආවේණික වූ ලක්‍ෂණ මෙන් ම විවිධත්වය හඳුනාගෙන ඇත්නම්
- ⋆ අනුරූපණය, සමාරෝපය, අනුකරණය සංවාද හා දෙබස් ඇසුරින් කරුණු ඉදිරිපත් කර තිබේ නම්,
- ⋆ ඒ ඒ චරිත රංගනයේ දී සමාජ සම්බන්ධතා හා බැඳී ඇති ආකාරය පිළිබඳ කරුණු දක්වා තිබේ නම්,

චරිත දෙක සඳහා 3 × 2 - ලකුණු 06

**(ii) සමාජ සම්බන්ධතා හා සාරධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මය ඇසුරෙන් විග්‍රහ කරන්න.**

- ⋆ පුරාවෘත්ත මගින් හෙළිවන සමාජ සම්බන්ධතා හා සාරධර්ම පිළිබඳ සාකච්ඡා කර තිබේනම්
  - පොරොන්දු කඩකිරීමෙන් වැළකීම
  - පවුල් සංස්ථාව ආරක්‍ෂා කිරීම
  - අඹු සැමි විශ්වාසය
- ⋆ සමාජීය සම්බන්ධතා
  - ඇදිහිලි විශ්වාස - චාරිත්‍ර වාරිත්‍ර - සාරධර්ම
- ⋆ සමාජ සහජීවනය
  - සහයෝගය - සමානාත්මතාව
  - ආචාර ධර්ම සුරැකීම - කැපවීම

සමාජ සම්බන්ධතා හා සාරධර්ම - 3 × 2 - ලකුණු 06

**(iii) පුරාවෘත්ත මගින් හෙළි වන බෞද්ධාගමික පසුබිම හා සමාජ විශ්වාස සන්නියකුම යාගය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.**

★ සංඛපාල හා දං උදි යන සන්නි යකුමේ කතා පුවත් ඇසුරින්,

★ සංඛපාල කථාව

කේළම් කීම, බොරුකීම, වෛරය, සැකය, ඊර්ෂ්‍යාව, තණ්හාව, කෝපය වැනි බෞද්ධාගමික සමාජ විශ්වාස .........

සමාජය නොපිළිගත් අයහපත් ක්‍රියාකලාප සමාජ විනාශයට බලපාන බව,

★ දං උදි කථාව

බොරුකීම වැනි පාප ක්‍රියා අකුසල කර්ම ලෙස පළදීම, පස්පවින් වැලකී යහපත් ජීවිත ගත කිරීමට බෞද්ධාගමික වශයෙන් සන්නිවේදනයක් ලබා දෙන බව,

බෞද්ධාගමික හා සමාජ විශ්වාස සඳහා 4 × 2 - ලකුණු 08

**3. අභිනය යන සංකල්පය දේශීය ශාන්තිකර්මවල ප්‍රාසංගික බව වර්ධනය කිරීමෙහිලා බෙහෙවින් බලපාන සාධකයක් වේ.**

**(i) කොහොඹා කංකාරියේ සතර අභිනය උපයෝගීතාව ඉහත පාඨය මගින් සාකච්ඡා කරන්න.**

★ ආංගික අභිනය -

උඩරට නර්තනයේ විශේෂතා වන නෘත්ත ලක්ෂණ අංග, ප්‍රත්‍යාංග, උපාංග සමායෝජනය තුළින් සිදුවන බව,

උදා :- ආවැන්දුම, යක්ඇනුම, හත්පදය ..........

★ වාචික අභිනය -

පූජා විධි රටාවෙහි ගායනයෙහි අන්තර්ගත නාදමාලා, නාට්‍යමය අවස්ථා, දෙබස් හා ශබ්ද උච්චාරණ ඇසුරෙන් සාකච්ඡා කර තිබීම

★ සාත්වික අභිනය -

සාත්වික අභිනය අවම වශයෙන් දක්නට ලැබෙන බව, නෘත්ත, නෘත්‍ය, නාට්‍ය ලක්ෂණ ඇසුරෙන් භාවමය හැඟීම් ප්‍රකාශනය පිළිබඳ තොරතුරු දක්වා තිබේ නම්,

උදා :- යක්කම්, ගුරුගේ මාලාව, ගබඩා කොල්ලය

★ ආහාර්ය අභිනය -

රංග වස්ත්‍රාභරණ, වේශ නිරූපණය, රංග භාණ්ඩ, සැරසිලි ආලෝකකරණය ............ යනාදිය මගින් කරුණු දක්වා තිබේ නම්,

ඉහත සඳහන් කරුණු ඇසුරෙන් කොහොඹා කංකාරියේ ප්‍රාසංගික බව වර්ධනය කිරීමෙහි ලා සතර අභිනය උපයෝගී කරගෙන ඇති ආකාරය සාකච්ඡා කර තිබීම

අභින තුනක් පිළිබඳ විස්තර කර ඇත්නම් 2 × 3 - ලකුණු 06

**(ii) බලි ශාන්තිකර්මයේ ඇති සෞන්දර්යාත්මක වටිනාකම ආහාර්ය අභිනය ඇසුරෙන් විග්‍රහ කරන්න.**

- ★ මල් බුලත් පුටුව සකසා ගැනීම
- ★ පුන් කලස තැබීම, බුලත් කොළ තැබීම, අටමගල තැබීම, මැටි පහන් දැල්වීම
- ★ නව ග්‍රහයින් සඳහා නියමිත වෘක්ෂවල කොළ වර්ගවලින් බලි මඩුවේ උඩුවියන අලංකාරව සකස් කර ගැනීම. උදා : තොලබෝ, හීරැස්ස, දිවිහිස.......... ආදී
- ★ මැස්සක් තනා හුඹස් මැටියෙන් බලිරූපය සකස්කර ගැනීම.
- ★ ඇතැම් බලි රෙදි කඩක චිත්‍රණය කිරීම.
- ★ ස්වභාවික යුෂ ගෙන බලියට අදාළ වර්ණ සංකලනය (රතු, කහ, නිල් වැනි මූලික වර්ණ)
- ★ බලි ඇදුරාගේ ඇඳුම් කට්ටලය

යනාදී කරුණු තුළින් බලි ශාන්තිකර්මයේ සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳ විග්‍රහයක් කර තිබීම

ආහාර්ය අභිනය විස්තර කිරීමට ලකුණු 03

සෞන්දර්යාත්මක වටිනාකම විග්‍රහ කිරීමට ලකුණු 03 - ලකුණු 06

**(iii) දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා වාචික හා ආහාර්ය අභිනය යොදා ගන්නා ආකාරය නාට්‍යමය අවස්ථාවක් මගින් විමසීමට ලක් කරන්න.**

★ දෙවොල් මඩුව

- දෙවොල් ගොඩබැසීම
- අඹ විදමන
- මරා ඉපැද්දීම
- ඇත් බන්ධනය, මී බන්ධනය

★ පහන් මඩුව

- දෙවොල් ගොඩබැසීම
- අඹ විදමන
- රාම මැරීම
- ඇත් බන්ධනය, මී බන්ධනය

උක්ත කරුණුවලින් එකක් තෝරා ගෙන වාචික හා ආහාර්ය අභිනය පිළිබඳ කරුණු දක්වා තිබේනම්,

වාචික අභිනය පිළිබඳ කරුණු දක්වීමට ලකුණු 04

ආහාර්ය අභිනය පිළිබඳ කරුණු දැක්වීමට ලකුණ 04 - ලකුණු 08

## IIකොටස

**4. දේශීය නර්තනය ව්‍යාප්ත කිරීමේ දී යුගාන්තර වශයෙන් විවිධ සාධක බලපා ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.**

**(i) උඩරට වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව සපයන්න.**

- ★ වන්නම් රචනා වූ කාලය හා රචකයින් පිළිබඳ විස්තර කර තිබීම.
- ★ වන්නම් රචනාවීම සඳහා බලපෑ හේතු සාධක විස්තර කර තිබීම.
- ★ භාරතීය ආභාෂය වන්නම් කෙරෙහි බලපා ඇති බව,
- ★ වන්නම්වල සුවිශේෂී ලක්‍ෂණ දක්නට ලැබෙන බව,
  - සාම්ප්‍රදායික ලක්‍ෂණ
  - ව්‍යුහය
  - නාදමාලාව
  - ප්‍රස්තුතය
- ★ විකාශනයේ දී නවාංග එක්කරගත් බව,

ඉහත සඳහන් කරුණු ඇසුරින් සවිස්තරාත්මකව ලියා ඇත්නම් - ලකුණු 06

**(ii) "නර්තන කලාවේ ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී දේශාටන වාර්තාද වඩා වැදගත් වේ." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.**

- ★ ස්පිල් බර්ජන්ගේ වාර්තාව
- ★ රොබට් නොක්ස්ගේ වාර්තාව
- ★ ඉබන් බතූතාගේ වාර්තාව

නර්තන කලාවේ ව්‍යාප්තිය ඉහත සඳහන් වාර්තා ඇසුරින්

නිදසුන් සහිතව පැහැදිලි කර ඇත්නම් - ලකුණු 06

**(iii) ක්‍රි.ව. 1980 න් පසු දේශීය නර්තනයේ ඇති වූ සාමාජීය වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.**

- ★ රූපවාහිනී මාධ්‍යයේ බලපෑම
- ★ සිනමාව මගින් කෙරෙන බලපෑම
- ★ පුවත්පත් මගින් සිදුවන බලපෑම
- ★ අන්තර්ජාලය මගින් සිදුවන බලපෑම

- ★ සමාජ උත්සව සඳහා ප්‍රාසාංගික නර්තන අංග යොදා ගැනීම
- ★ විදේශීය අභාෂය දක්නට ලැබීම (පෙරදිග / අපරදිග)
- ★ රංග වස්ත්‍රාභරණ විචිත්‍රත්වයෙන් නිර්මාණය වීම

- ★ නර්තන සංදර්ශන, තරග පැවැත්වීම
- ★ නර්තන, වාදන කණ්ඩායම් බිහිවීම
- ★ අධ්‍යාපනික අවස්ථා වර්ධනය වීම
- ★ නර්තනය හා බැඳි කරුණු ඇතුළත් විමර්ශන හා විචාර ග්‍රන්ථ බිහිවීම

උක්ත කරුණු ඇසුරුකර ගනිමින් විස්තර කර ඇත්නම් - ලකුණු 08

**5. (i) සොකරි නාටකයේ එන චරිත දෙකක් නම් කර, එම එක් එක් චරිතයට භාවිත බෙර පදය හා කවිය බැගින් ලියන්න.**

- සොකරි
  - බෙරපදය - දොං ජිජි ගත
  - කවිය - අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී.....................
- ආඬිගුරු
  - බෙරපදය - දොං ජිජි ගත
  - කවිය - කතරගමින් මට වරම් ලැබෙන්නේ.....................
- පරයා
  - බෙරපදය - දොං ජිජි ගත
  - කවිය - ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ........................

චරිත දෙකක් නම් කර තිබීම ලකුණු 02
බෙර පදය හා කවිය බැගින් ලියා තිබීම ලකුණු 04 - ලකුණු 06

**(ii) "ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන් ම, ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ." නිදර්ශනාත්මකව විග්‍රහයක් කරන්න.**

★ ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ ඇති බව,

★ සාමූහිකව නර්තනයේ යෙදීම.

★ සරල බව හා එම කම

★ උපකරණ භාවිතය

★ ජීවන වෘත්තීන් හා බැඳි රිද්මරටා පාදක වීම.

- ගැමි නැටුම් හා බැඳි ගායනා තුළින් ගැමි ජනතාවගේ ජීවන රටාව විද්‍යාමාන වන බව,
  - ගැමි ඇදහිලි හා විශ්වාස
  - වෘත්තීන්හි සම්භවය
  - සමාජ සහජීවනය

උදා :-
- ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා ................
- බෝ අත්තට වැඳ සිරස නමන්නේ ...........
- උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා .......
- ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට ...........
- උඩහ ගෙදර රන්කිරි නංගිලත් ඇවිල්ලා .........
- අක්කන්ඩියේ යමු අපි පන් නෙලන්නට ..........

ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විස්තර කිරීමට ලකුණු 03
ඒ හා බැඳි ගායනාවලින් ජීවන රටාව පිළිබිඹු වන අයුරු සාකච්ඡා කිරීමට ලකුණු 03 - ලකුණු 06

**(iii) කෝලම් චරිත නිරූපණය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය චරිත දෙකක් ඇසුරෙන් විශ්ලේෂණය කරන්න.**

★ කෝලම් චරිත දෙකක් නම් කිරීම.

ජස, නොංචි, මුදලි, අණබෙර ...................

★ ශුද්ධ මාත්‍රා පද, මුගුරු පද, ගිරිදේවි පද, දෙතාලයේ පද.......... කෝලම් චරිත නිරූපණය සඳහා යොදා ගෙන ඇති බව,

★ ශාස්ත්‍රීය පද ඇසුරෙන් චරිත නිර්මාණය වී ඇති බව,

★ චරිත ස්වභාවයන් නර්තන, ගායන, වාදන යන අංගයන්ගේ සහසම්බන්ධයෙන් මනාව නිරූපණය කරමින් ප්‍රේක්ෂකයින්ට වින්දනයක් හා පණිවුඩයක් ලබා දෙන බව,

★ චරිත නිරූපනය සඳහා නර්තනය යොදා ගැනීම තුළින් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යයට හා උපහාසයට ලක්කර ඇති බව,

★ සාම්ප්‍රදායික බෙර පද, තාල හා කවි ගායනා චරිත නිරූපණයේ දී ප්‍රබල වන බව,

නර්තනය යොදා ගෙන ඇති ආකාරය චරිත දෙකක් ඇසුරෙන් විශ්ලේෂණය කර ඇත්නම්

එක් චරිතයකට ලකුණු 4 × 2 - ලකුණු 08

## IIIකොටස

**6. පහත සඳහන් වගුවෙහි (අ),(ආ),(ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.**

**(i) (අ) අඩයාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය කවුද? ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.**

රුක්මණී දේවි අරුණ්ඩේල්

- ක්‍රි.ව. 1936 දී චිදම්බරම් දේවාලයේ නටරාජා වෙනුවෙන් පූජා නර්තනයක් ඉදිරිපත් කළ බව,
- ඇනා පැව්ලෝවාගෙන් බැලේ නර්තන කලාව හදාරා ඇති බව,
- නව ආකාරයක චිත්තාකර්ෂණීය රංග වස්ත්‍රාභරණ සහ ආභරණ යොදා ගත් බව,
- භරත නර්තනය ඉගැන්වීම සඳහා අඩයාර්හි කලා ක්ෂේත්‍ර ආයතනය ආරම්භ කළ බව,
- රාධ, ක්‍රිෂ්ණ, රාම්ලීලා වැනි නෘත්‍ය නාට්‍ය නිර්මාණය කළ බව,
- 1956 දී පද්මභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ බව,

ඉහත කරුණු අනුව විස්තර කර ඇත්නම් - ලකුණු 06

**(ii) (ආ) කථකලි නර්තනයේ ශාස්ත්‍රීය නර්තන අංගය තෝරා, එම නර්තනය පිළිබඳ කරුණු දක්වන්න.**

**තෝඩායම්**

- කථකලි නර්තනයේ පළමු නර්තන අංගය තෝඩායම් බව,
- මලයාලි හා සංස්කෘත බසින් ගීත රචනා වී ඇති බව,
- දේව ස්තෝත්‍ර, ශ්ලෝක ආදිය දෙවියන්ට උපහාර වශයෙන් ගායනා කරමින් දෙවියන් උදෙසා පැවැත්වෙන උපහාර නර්තනයක් බව,
- කඩතිරයට පිටුපසින් සිට මෙම නර්තනය ඉදිරිපත් කරන බව,
- ආධුනිකයන්ට මෙම නර්තන අංගය ඉතා වැදගත් බව,

නර්තන අංගය තෝරා ගෙන විස්තර කර ඇත්නම් - ලකුණු 06

**(iii) (ඉ) කථක් නර්තනය හා සබැඳි වාද්‍ය භාණ්ඩවල ව්‍යුහය හා ඒවායේ විශේෂතා ගෙනහැර දක්වන්න.**

**තබ්ලා**

- කථක් නර්තන සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩය වන බව,
- කොටස් දෙකකින් යුක්ත වන බව,
- දකුණතින් වාදනය කරනු ලබන කොටස දහිනා හෙවත් තබ්ලා නමින් ද වමතින් වයන කොටස බාය හෙවත් ඩග්ගා නමින් ද හඳුන්වන බව,
- හම් යොදා දෙඇස් නිර්මාණය වී ඇති බව,
- කළු පැහැති බදාමයක් ස්ථිර වශයෙන් යොදා ඇති බව,
- තබ්ලාවෙන් උපදින නියමිත අක්ෂර ඇති බව,

**පක්වාජ්**

- මෝගල් සමයේ භාවිත වූ වාද්‍ය භාණ්ඩයක් බව,
- මැදින් මහත්වන සේ දෙකෙළවර ක්‍රමයෙන් කුඩා වී යන අයුරින් ලීයෙන් තනා ඇති බව,
- දකුණු ඇසෙහි විශ්කම්භය අඟල් 6-7 ක් හා වම් ඇසෙහි විශ්කම්භය අඟල් 9-10 වන බව,
- දකුණු ඇස සඳහා නිත්‍ය බදාමයක් යොදා ඇති අතර වම් ඇස සඳහා පිටිවලින් සකස් කරන තාවකාලික බදාමයක් යොදා ඇති බව,
- රූප සටහන් මගින් ඉහත කරුණු විස්තර කර ඇත්නම්,

එක් වාද්‍ය භාණ්ඩයක් පිළිබඳ විස්තර කිරීමට ලකුණු 04 බැගින් 4 × 2 - ලකුණු 08

**7. (i) රසභාව දැකිය හැකි අවස්ථාවක් රටයකුම හෝ සන්නියකුම ශාන්තිකර්මය ඇසුරෙන් විස්තර කරන්න.**

**<u>නානුමුරය</u>**

- නානුමුරය, කපුයක්කාරිය, දරුනැලවිල්ල වැනි අවස්ථා තුළින් රසභාව දක්නට ලැබෙන බව,
- රටයකුමේ නානුමුරය ඇසුරෙන් භාවාත්මක රූපණ අවස්ථා ඉස්මතු වී ඇති ආකාරය, දෙබස්, සංවාද, කවි, ගායනා, නර්තන, රංගවස්ත්‍ර, රංග භාණ්ඩ ආදී ....... යොදා ගෙන ඇඟයීමට ලක්කර තිබීම
- යකැදුරා රිද්දි බිසවගේ චරිතයට සමාරෝපන වීම
  උදා :- නානුගෑම, හිස පීරීම, සළු පැළඳවීම ............ ආදී
- කපුයක්කාරියේ දී පරිහරණය කරනු ලබන පේෂකර්මය හා සම්බන්ධ කපුගස, කපුයන්ත්‍රය ........ ආදී

**<u>සන්නියකුම</u>**

- සූනියම් යක්ෂණියගේ අවස්ථා තුන
  1. තරුණිය  2. ගැබිණි කාන්තාව  3. දරුවා සහ මව  විස්තර කර තිබීම
- කළුයකා, රීරියකා, අබිමාන යකා වැනි අවස්ථා තුළින් රසභාව දැකිය හැකි බව උදාහරණ මගින් විස්තර කර තිබීම
- පාලි සහ සන්නි උදාහරණ ලෙස ගෙන රසභාව දක්නට ඇති බව විස්තර කර තිබීම
- මරු සන්නි යකාගේ රක්ත වර්ණ ඇස්, දළ සහිත කළුවන් මුහුණ, කළුවන් කෙස්වැටිය සහිත ඇඳුම් පැළඳුම් තුළින් රසභාව දැකිය හැකි බව විස්තර කර තිබීම
- සන්නි දහඅට පිළිබඳව විස්තර කර තිබීම

ඉහත කරුණු ඇසුරින් එක් ශාන්තිකර්මයක් තෝරා ගෙන විස්තර කර ඇත්නම් - ලකුණු 06

**(ii) බටහිර බැලේ (Ballet) සංකල්පය සහ දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය සංසන්දනය කරන්න.**

**<u>බටහිර බැලේ සංකල්පය</u>**

- ඉතාලි භාෂාවෙන් බිඳී ආ වචනයක් ලෙස බැලේ නාට්‍ය හඳුන්වන බව,
- BALLO, BALLETTO, BALLET යන නම්වලින් හඳුන්වන බව,
- රිද්මය මූලික කරගත් චලන වැඩි වශයෙන් භාවිත වන බව,
- වාචික අභිනය නොයෙදෙන බව,
- සැහැල්ලු ඇඳුම් පැළඳුම් භාවිත වන බව,
- පැනීම්, කැරකීම් වැඩි වශයෙන් යොදා ගන්නා බව,
- ශිල්පීය ක්‍රමවේදයන් අනුගමනය කරන බව,
- ස්කල්පෙ සපත්තු පැළඳීම විශේෂ වන බව,

**දේශීය මුද්‍රානාට්‍ය සංකල්පය**

- දේශීය නර්තන සම්ප්‍රදායන් හා භාරතීය නර්තනයේ ආභාෂය ලබමින් නිර්මාණය වූ නාට්‍ය මුද්‍රානාට්‍ය ලෙස හඳුන්වන බව,
- තාලානුකූල හා ප්‍රකාශනාත්මක චලන වැඩි වශයෙන් දක්නට ඇති බව,
- සංගීතය හා පසුබිම් ගායනය යොදාගන්නා බව,
- මිත්‍යා කතා, ආගමික කතා, ඉතිහාස කතා ඇසුරින් නිර්මාණය වන බව,
- ඉඟිනළු නමින් හඳුන්වන බව,
- භාරතීය හා දේශීය ලක්ෂණ රංගවස්ත්‍ර තුළින් ඉස්මතු වන බව,
- පෙර අපර නර්තනයන් අනුකරණය කරන බව,

වෙන්කොට දක්වා ඇති කරුණු සංසන්දනය කරමින් සාකච්ඡා කර තිබේ නම් - ලකුණු 06

**(iii) නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරණයේ ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- භාරතීය නර්තන සම්ප්‍රදායන් ඇසුරෙන් චරිත සඳහා අවශ්‍ය නර්තන යොදා ගෙන ඇති බව, (උදා : කථකලි, මනිපුරි)
- අවස්ථා නිරූපණය සඳහා දේශීය චලන මූලික කොට ඇති බව,
- හංසවිල හා ගිසෙල්ලි යන බැලේ නාට්‍ය ඇසුරෙන් චලන ස්වභාවයන් හා රංග රචනය කර ඇති බව, (උඩපැනීම, ඇඟිලිවලින් ඇවිදීම)
- භාරතීය හා බටහිර සංගීතය අවස්ථා නිරූපණ සඳහා යොදා ඇති බව,
- චරිත සහ අවස්ථා තීව්‍ර කර දක්වීම සඳහා රංග වස්ත්‍රාභරණ, පසුතල නිර්මාණ, සංගීතය, විදුලි ආලෝකනය භාවිතා කර ඇති බව,

ඉහත කරුණු ඇසුරෙන් විග්‍රහයක් කර ඇත්නම් - ලකුණු 08

## IVකොටස

**8. නව නර්තන කලාවේ ප්‍රවණතා දේශීය සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රවර්ධනයට බෙහෙවින් බලපා ඇත.**

**(i) සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට එක් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.**

- සාම්ප්‍රදායික නර්තනයේ විධිමත් ලක්ෂණ ඉස්මතු වී සංස්කෘතිය, සාරධර්ම ආරක්ෂා වී ඇති බව,
- නව නිර්මාණ බිහිවීම හා එහි ප්‍රවර්ධනය සිදු වී ඇති බව,
- වෘත්තීය අවස්ථා මෙන් ම ජාත්‍යන්තර සබඳතා ගොඩනැගී ඇති බව,
- ග්‍රන්ථකරණයට යොමු වීම සහ අධ්‍යාපන අවස්ථා පුළුල් වී ඇති බව,
- දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය වන බව,

සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට
එක් කිරීම විස්තර කර ඇත්නම් ලකුණු 03

ඒ තුළින් එහි වැදගත්කම පිළිබඳව විස්තර කර ඇත්නම් ලකුණු 03 - ලකුණු 06

**(ii) නව ප්‍රවණතා හමුවේ සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කළ හැකි ද? මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.**

- නර්තනය සංරක්ෂණය වන ආකාරය, නොවන ආකාරය පිළිබඳ සාකච්ඡා කර තිබේනම්,
- වර්තමාන ප්‍රවණතා හමුවේ ඉදිරිපත් කරන සාම්ප්‍රදායික නර්තනයේ ස්වභාවය සංරක්ෂණයට බලපාන ආකාරය විමසා ඇත්නම්,

සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය පිළිබඳව විස්තර කර ඇත්නම් ලකුණු 03
නව ප්‍රවණතා පිළිබඳව විස්තර කර ඇත්නම් ලකුණු 03 - ලකුණු 06

**(iii) "චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අතර අද්‍යතන නිර්මාණවල එය වඩාත් ඉස්මතු වේ." ඇගයීමක් කරන්න.**

- චිත්‍ර කලාවේ මූලිකාංග වන, ඇඳීම, ඇඹීම, කැටයම් කැපීම, වර්ණ ගැන්වීම, තෙළීම, රේඛා, හැඩතල, මෝස්තර ආදිය අද්‍යතන නර්තනයට යොදා ගෙන ඇති බව විස්තර කර ඇත්නම්,
- සැරසිලි, රංගභූමි අලංකරණය, පසුතල නිර්මාණය, රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ, වෙස් ගැන්වීම ආදිය අද්‍යතන නර්තනයට යොදා ගෙන ඇති බව,

ඉහත කරුණු ඇසුරෙන් විස්තර කර ඇත්නම් ලකුණු 08

**9. (i) පැරණි හා නූතන රංග භූමි අලංකරණය හා විවිධ ශිල්පක්‍රම පිළිබඳ තුලනාත්මක ව පිරික්සන්න.**

**<u>පැරණි රංග භූමි</u>**

- පැරණි රංග භූමි යන්න අර්ථ දක්වා ඇත්නම්,
- පැරණි රංග භූමි සහ ඒවායෙහි සුවිශේෂතා විස්තර කර ඇත්නම්,
- දේශීය ශාන්තිකර්ම, රංග භූමි සැකසීම සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කලාත්මකව හසුරුවා ඇති ආකාරය ඇගයීමට ලක් කර ඇත්නම්,
- දේශීය රංග භූමි සකසා ගැනීමේ සම්මතයන් සහ යොදා ගන්නා අමුද්‍රව්‍ය කවි මගින් දක්වා ඇත්නම්,
- රංග භූමියේ ඇති සැරසිලි නම් කර ඇත්නම්,

**<u>නූතන රංග භූමි</u>**

- නූතන රංග භූමි යන්න අර්ථ දක්වා ඒවායෙහි සුවිශේෂතා විස්තර කර ඇත්නම්,
- නූතන රංග භූමි අලංකරණයේ විවිධ ශිල්ප ක්‍රම විස්තර කර ඇත්නම්,
  (වේදිකා ආලෝකනය, පසුතල නිර්මාණ , තාක්ෂණික ශිල්ප ක්‍රම ......)

පැරණි හා නූතන රංගභූමි අලංකරණ පිළිබඳව විස්තර කර ඇත්නම් ල. 03
විවිධ ශිල්ප ක්‍රම පිළිබඳව තුලනාත්මකව විස්තර කර ඇත්නම් ල. 03 - ලකුණු 06

**(ii) දේශීය ශාන්තිකර්මවල රංගභූමි අලංකරණයේ දී භාවිත වන අමුද්‍රව්‍ය, වර්ණ හා සැරසිලි පිළිබඳ විමසුමක් කරන්න.**

- දේශීය ශාන්තිකර්මවල රංගභූමි අලංකරණයේ දී ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතා වන බව,
- කැටයම් කලාව ප්‍රබල ලෙස රංගභූමි අලංකරණයේ දී විචිත්‍රත්වයෙන් යුතුව භාවිතා වන බව,
- විවිධ සැරසිලි කලාත්මකව භාවිතා කර හඳුන්වන බව,
  (මඬුව, යහන්, තොරං, වීදි, පිදේනි තටු, මල්යහන්, කත්තිරික්ක, සන්නිකුඩුව, බිසෝ කප, කාලපන්දම් ගස ......... ආදී නම් කිරීම)
- රූප සටහන් මගින් ඉදිරිපත් කර තිබේනම්,
- පැරණි සහ නූතන ශාන්තිකර්ම රංගභූමි සහ ඒවායෙහි වෙනස්කම්වල සුවිශේෂතා පිළිබඳ විස්තර කර තිබේනම්,

රංගභූමි අලංකරණයේ දී භාවිතා වන අමුද්‍රව්‍ය පිළිබඳව විස්තර කර ඇත්නම් ලකුණු 03
එහි වර්ණ හා සැරසිලි පිළිබඳ විමසුමක් කර ඇත්නම් ලකුණු 03 - ලකුණු 06

**(iii) "අද්‍යතන වේදිකාවේ දක්නට ලැබෙන වෙස් මෝස්තර හා රංගාලෝකය, නිර්මාණාත්මක නර්තනයේ ප්‍රාසාංගික බවට වඩාත් ඉවහල් වේ." විග්‍රහයක් කරන්න.**

- රංග වස්ත්‍රාභරණ හා වේෂ නිරූපනවල ප්‍රාසාංගික බව,
- රංග වස්ත්‍රාභරණ කොටස් හා අනු කොටස් වශයෙන් (හිස් පැළඳුම්, ආභරණ) විචිත්‍ර වූ වර්ණ භාවිත කරන බව,
- වෙස් ගැන්වීම, වේදිකා ආලෝකනය පිළිබඳ ව අවබෝධයකින් යුතුව යොදා ගන්නා බව,
- පෙර අපර දෙදිග හැඩතල, මෝස්තරවල ආභාෂය අද්‍යතන නිර්මාණවලට යොදා ගන්නා බව,
- ඩිජිටල් ආලෝකකරණ නව තාක්ෂණය භාවිතා කර ඇති බව,
- අංගරචනවල වෙනස්කම (ඇස්, මූහුණ, තොල් ආලේපන රේඛා මාධ්‍යයෙන් විවිධ හැඩගැන්වීම් කර ඇති බව)

අද්‍යතන වේදිකාවේ දක්නට ලැබෙන වෙස් මෝස්තර හා රංගාලෝකය පිළිබඳව
විස්තර කර ඇත්නම් ලකුණු 04
ඒවා නිර්මාණාත්මක නර්තනයේ ප්‍රාසාංගික බවට ඉවහල් වන ආකාරය
විග්‍රහ කර ඇත්නම් ලකුණු 04 - ලකුණු 08